# ඕස්ට්‍රේලියාවේ දේශ සීමාවන් සැමදාම ආරක්ෂා කිරීම සිදුවේ.

15.12.17

බොහෝ ඕස්ට්‍රේලියානුවන් මෙම නිවාඩු සමයේ විවේකයෙන් සහ සුව පහසුව සිටියදී අපගේ දේශ සීමා ආරක්ෂක බලධාරීහු ඕස්ට්‍රේලියාවේ දේශසීමා විමර්ශනය සහ රට තුලට අනවසරයෙන් ඇතුළුවීමට උත්සාහ කිරීම් වලකාලීමට වෙහෙසවී කටයුතු කරති. ඕස්ට්‍රේලියාවේ ස්වෛරී දේශසීමා මෙහෙයුම් අණදෙන නිලධාරී එයාර් වයිස් මාර්ෂල් (Commander of Australia's Operation Sovereign Borders, Air Vice-Marshal) Stephen Osborne ගෙන් නිවාඩු සමයේ බෝට්ටු මඟින් සිදුවන මිනිස් ජාවාරම වලකාලීමට ගනු ලබන ක්‍රියා මාර්ග පිළිබඳව අපි විමසා සිටියා.

"ඕස්ට්‍රේලියාවේ දේශසීමා වසරේ සැම දිනකම විමර්ශනයට, මුර සංචාරයට සහ ආරක්ෂාවට ලක්කරන බව" එයාර් වයිස් මාර්ෂල් (Air Vice-Marshal) Stephen Osborne පැවසිය.

"අපි නිරන්තර පරීක්ෂාවෙන් බලා සිටිනවා, එමෙන්ම කවුරුන් හෝ අනවසරයෙන් බෝට්ටු මඟින් ඕස්ට්‍රේලියාවට ඇතුළුවීමට යත්න දැරුවහොත් අතරමගදී නවත්වා ආපසු හරවා යැවීමට නිරන්තර සූදානමින් පසුවෙනවා".

"දැන් බොහෝ කාලයක සිට අනවසර බෝට්ටු මඟින් ඕස්ට්‍රේලියාවට ඇතුළුවීමට ඉඩ ලැබී නැහැ. කෙසේවෙතත් අවාසනාවට තවමත් අනවසර බෝට්ටු මඟින් ඕස්ට්‍රේලියාවට ඇතුළු වීමට උත්සාහ දැරීම පලක් ඇතැයි සිතන අයවලුන් සිටිනවා".

මෙම නිවාඩු සමයේදී ඕස්ට්‍රේලියානු දේශ සීමා ආරක්ෂණයේ යම් ලිහිල් තත්වයක් පවතීවි දැයි විමසූ විට එයාර් වයිස් මාර්ෂල් (Air Vice-Marshal) Osborne දැඩිව පවසා සිටියේ "නැත" යන්නයි.

"කවුරුන් හෝ සිතා සිටිනවා නම් පොදු නිවාඩු දිනයන් හිදී දේශ සීමාවන් සමීප පරීක්ෂාවනට ලක් නොවනවා යැයි කියා, එය වැරදීමක්. කවුරුන් හෝ අනවසරයෙන් බෝට්ටු මඟින් කුමන කාලයක දී වුව ඕස්ට්‍රේලියාවට පැමිණීමට උත්සාහ දරයි නම් ඒවා නවතා ආපසු හරවා යැවීම සිදුවේවි."

මිනිස් ජාවාරම් කරුවන්ගේ බෝට්ටු මත ජීවිත පරදුවට තබා විදේශයන් හි සිට පැමිණෙන පුද්ගලයින් වළකාලීමට ඕස්ට්‍රේලියාවේ සිටින ප්‍රජාවන් හටද වැදගත් කාර්ය භාරයක් හිමිවෙන බව එයාර් වයිස් මාර්ෂල් (Air Vice-Marshal) Osborne පැවසීය.

"ඕස්ට්‍රේලියාවේ සිටින පුද්ගලයින්ට පුළුවන් අනෙකුත් රටවල වෙසෙන තම පවුල් සහ හිතමිතුරන්ගේ තීරණ කෙරෙහි යම් බලපෑමක් ඇතිකරන්න" ඔහු පැවසුවේය. කවුරුන් හෝ මෙහි සිටින කෙනෙකු විදේශයක සිටින තම ඥාති හිතමිතුරෙකුට පැවසුවහොත් තවදුරටත් බෝට්ටුවක නැගී අනවසරයෙන් ඕස්ට්‍රේලියාවට පැමිණීමට හැකිය කියා ඔවුන් කරන්නේ තම ඥාතියා හෝ මිතුරාගේ මුදල් සහ ජීවිතය අනතුරේ හෙලීමක්.

මට ඕනා ඕස්ට්‍රේලියාවේ සිටින පුද්ගලයින් උනන්දු කරවන්න හරි දෙය කරන්න , එමඟින් පිට රටවල වෙසෙන මිතුරන් සහ පවුල් දැනුවත් කරන්න ඕස්ට්‍රේලියාවට පැමිණීමට ඇති එකම ක්‍රමය නම් ඕස්ට්‍රේලියානු විසා ලබා ගැනීමෙන් බව.

එයාර් වයිස් මාර්ෂල් (Air Vice-Marshal) Osborne අවසන් වශයෙන් සඳහන් කලේ වැරදි මාර්ග හරහා ඕස්ට්‍රේලියාවට පැමිණීමට උත්සාහ දරන පුද්ගලයින් තම ජීවිත සහ මුදල් අරුතක් නොමැති දෙයක් සඳහා අනතුරේ හෙලන බව නැවතත් සඳහන් කරමින්.ඔවුනට කිසි දිනක ඕස්ට්‍රේලියාවේ පදිංචි වීමට ඉඩ නොලැබෙනු ඇත.